මාධ්‍ය නිවේදනය

**2018 වර්ෂයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සියයට 3.2 ක වර්ධනයක් වාර්තා කරයි.**

**ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු නිකුත් කිරීම**

2018 වර්ෂයේ සිව්වන කාර්තුව සහ සමස්ත වර්ෂය සඳහා


ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය

දු.ක. 94-11-2147071 ෆැක්ස්: 94-11-2877938 ඊමේල්: national.accounts@statistics.gov.lk


.......................................................................................................................

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018 සිව්වන කාර්තුව සහ 2018 වර්ෂය සඳහා දළ දේශීය නිෂ්පාදිතය සහ අනෙකුත් සාර්ව ආර්ථික දර්ශක ඇස්තමේන්තු කර නිකුත් කොට ඇත.

වර්ෂ 2018 (ජනවාරි සිට දෙසැම්බර්) සඳහා ස්ථාවර මිල (2010) ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 9,644,728 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2017 වර්ෂයේ දී මෙහි අගය රුපියල් මිලියන 9,344,839 ක් විය. ඒ අනුව 2018 වර්ෂය සඳහා ආර්ථික වර්ධන වේගය සියයට 3.2 ක් ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඇස්තමේන්තු කොට ඇත.

පවත්නා මිල ගණන් යටතේ 2018 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකාර්මික ආර්ථික කටයුතු විසින් දෙනු ලැබූ දායකත්වය සියයට 7.9 කි. කර්මාන්ත හා සේවා අංශ පිළිවෙලින් සියයට 27.0 ක සහ සියයට 56.8 ක දායකත්වයක් දළ දේශීය නිෂ්පාදිතය සඳහා ලබා දී ඇති අතර භාණ්ඩ මත අයකෙරෙන ශුද්ධ බදු (සහනාධාර අඩු කළ) දළ දේශීය නිෂ්පාදිතය සඳහා සියයට 8.3 ක දායකත්වයක් ලබා දී ඇත.

කෘෂිකාර්මික ආර්ථික කටයුතු, කර්මාන්ත ආර්ථික කටයුතු, සේවා ආර්ථික කටයුතු යන අංශ ත්‍රිත්වය ම 2018 වර්ෂයේ දී ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. එහි දී කෘෂිකාර්මික ආර්ථික කටයුතු වාර්තා කර ඇති වර්ධනය සියයට 4.8 කි. කර්මාන්ත ආර්ථික කටයුතු සහ සේවා ආර්ථික කටයුතු සඳහා වර්ධන වේගයන් පිළිවෙලින් සියයට 0.9ක් සහ සියයට 4.7ක් වශයෙන් වාර්තා වේ.

**කෘෂිකාර්මික ආර්ථික කටයුතු**

කෘෂිකාර්මික ආර්ථික කටයුතු 2018 වර්ෂයේ දී වාර්තා කර ඇති සියයට 4.8 ක ධන වර්ධනය සඳහා "වී වගා කිරීම" සියයට 33.9 ක කැපී පෙනෙන ධන වර්ධනයක් වාර්තා කරමින් දායක වී ඇත. එසේ ම "පළතුරු වගා කිරීම", "මිරිදිය ධීවර කටයුතු", පොල් ඇතුලත් වන"තෙල් සහිත පළතුරු බෝග වගාව", "කුළුබඩු වගා කිරීම", "සත්ත්ව නිෂ්පාදන", "වී හැර අනෙකුත් ධාන්‍ය වගාව" සහ "එළවලු වගා කිරීම" පිළිවෙලින් සියයට11.2 ක්, සියයට 7.1 ක්, සියයට 6.3 ක්, සියයට 5.3 ක්, සියයට 4.7, සියයට 2.8 ක් සහ සියයට 2.6ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. මේ අතර ප්‍රධාන කෘෂිකාර්මික ආර්ථික කටයුතු කිහිපයක් පසුබෑම් වාර්තා කර ඇත. එහිදී "කරදිය ධීවර කටයුතු" සියයට 2.0ක්, "වන වගා හා දැව" සියයට 0.9ක්, "තේ වගා කිරීම" සියයට 0.8ක් සහ "රබර් වගා කිරීම" සියයට 0.6ක් වශයෙන් වාර්තා කර ඇත්තේ සෘණ වර්ධන වේගයන් ය.

**කර්මාන්ත ආර්ථික කටයුතු**

කර්මාන්ත ආර්ථික කටයුතු 2018 වර්ෂයේ දී සියයට 0.9 ක වර්ධනයක් අත් පත් කරගෙන ඇත. එහිදී නිමැවුම් කර්මාන්ත කටයුතු සියයට 3.0ක වර්ධන වේගයක් වාර්තා කර ඇති නමුත් "ඉදිකිරීම් කර්මාන්තය" සහ "පතල් හා කැනීම් කර්මාන්තය" පිළිවෙලින් සියයට 2.1ක් සහ සියයට 5.1ක් වශයෙන් සෘණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

නිමැවුම් කර්මාන්ත කටයුතු වාර්තා කර ඇති සියයට 3.0ක වර්ධනය සඳහා "රෙදිපිළි, නිමි ඇඳුම්, සම්භාණ්ඩ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනය" සහ "ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදනය" යන ප්‍රධාන කර්මාන්ත ආර්ථික කටයුතු ද්විත්වය පිළිවෙලින් සියයට 5.5 ක් සහ සියයට 3.6 ක් වශයෙන් සැලකිය යුතු වර්ධන වේගයන් වාර්තා කරමින් දායක වී ඇත. එසේ ම එහිදී "මූලික ලෝහ සහ ව්‍යුවහාත්මක ලෝහ නිෂ්පාදනය", "ලෝහ නොවන අනෙකුත් ඛනිජ නිෂ්පාදනය" සහ "රබර් හා ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය", පිළිවෙලින් සියයට 7.1 ක්, සියයට 6.7 ක් සහ සියයට 2.4 ක් වශයෙන් ධන වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් "පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදනය", "කඩදාසි නිෂ්පාදනය" සහ "යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදනය" පිළිවෙලින් සියයට 8.2ක්, සියයට 4.1ක් සහ සියයට 1.4ක් වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

2018 වර්ෂයේ දී "විදුලිය, ගෑස්,වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම" සියයට 4.1 ක වර්ධන වේගයක් වාර්තා කර තිබේ.

### සේවා ආර්ථික කටයුතු

කෘෂිකාර්මික ආර්ථික කටයුතු සහ කර්මාන්ත ආර්ථික කටයුතු සමග සැසඳීමේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි කොටසක් ආවරණය කරන (සියයට 56.8) සේවා ආර්ථික කටයුතු 2018 වර්ෂයේ දී සියයට 4.7 ක සැලකිය යුතු වර්ධන වේගයක් වාර්තා කර ඇත. සේවා අංශයේ මෙම සමස්ත වර්ධනය සඳහා ඉහළ දායකත්වයක් ලබා දී ඇති "මූල්‍ය සේවා" "තොරතුරු තාක්ෂණ සේවා" "රක්ෂණ සේවා", "විදුලි සංදේශ සේවා", "නවාතැන් සහ ආහාර පාන සැපයීම්", "තොග හා සිල්ලර වෙළදාම" සහ "අනෙකුත් පෞද්ගලික සේවා" පිළිවෙලින් සියයට 11.8 ක්, සියයට 10.8 ක්, සියයට 10.0 ක්, සියයට 9.4 ක්, සියයට 5.5 ක්, සියයට 5.0ක් සහ සියයට 4.8ක් වශයෙන් ඉහල වර්ධන වේගයන් වාර්තා කර ඇත. කෙසේ වෙතත් "රූපවාහිනී හා ගුවන් විදුලි විකාශන කාර්යයන්" සහ "රාජ්‍ය පරිපාලන කටයුතු" පිළිවෙලින් සියයට 7.0ක් සහ සියයට 0.6ක් වශයෙන් ඍණ වර්ධන වේගයන් වාර්තා කර ඇත.

## 2018 වර්ෂයේ සිව්වන කාර්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කොට ඇති 2018 වර්ෂයේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය ස්ථාවර මිල ගණන් යටතේ රුපියල් මිලියන 2,680,362 කි. ඒ අනුව 2018 වර්ෂයේ සිවවන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතය 2017 වර්ෂයේ සිව්වන කාර්තුවේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව සියයට 1.8 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. එහිදී කෘෂිකාර්මික කටයුතු සියයට 4.5 ක වර්ධනයක් වාර්තා කරන අතරතුරදී සේවා ආර්ථික කටයුතු සියයට 4.3 ක වර්ධන වේගයක් වාර්තා කර ඇත. 2018 වර්ෂයේ සිව්වන කාර්තුවේ දී කර්මාන්ත ආර්ථික කටයුතු සියයට 3.6 ක ඍණ වර්ධන වේගයක් වාර්තා කර ඇත.

2018 සිව්වන කාර්තුවට සහ 2018 වර්ෂයට අදාල ජාතික ගිණුම් ඇස්තමේන්තු පිළිබඳව විස්තරාත්මක තොරතුරු ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ www.statistics.gov.lk වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කොට ඇති බව දෙපාර්තමේන්තුව පවසයි.

I.R. Bandara

අයි. ආර්. බණ්ඩාර

අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව